**රුහුණ විශ්වවිද්‍යාලය**
**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි 3000 ස්ථලය**
**පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්**

**POS 31523/31623 - දේශපාලන සමාජ විද්‍යාව**

ප්‍රශ්න <u>හතරකට</u> **<u>(04)</u>** පමණක් පිළිතුරු සපයන්න.

**කාලය : පැය 03 යි.**

---

01. "සමාජීය සිදුවීම්වල (Social Events) දේශපාලන හේතුකාරක අධ්‍යයනය කිරීම කෙරෙහි දේශපාලන සමාජ විද්‍යාවේ මූලික අවධානය යොමු වේ." ඉහත ප්‍රකාශය විග්‍රහ කරන්න.
(ලකුණු 15)

02. පහත සංකල්ප සම්භාව්‍ය මාක්ස්වාදයෙහි විස්තර වන ආකාරය පැහැදිලි කරන්න.

i. ඓතිහාසික භෞතිකවාදය (ලකුණු 05)
ii. පන්තිය (සමාජ පන්තිය) (ලකුණු 05)
iii. පන්ති අරගලය සහ විප්ලවය (ලකුණු 05)

03. 20 වන සියවසෙහි වෙනස්වන සමාජ දේශපාලන තත්ත්වයන්හි සංකීර්ණත්වය නව මාක්ස්වාදීන් විස්තර කළේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 15)

04. "බලය" පිළිබඳ මැක්ස් වෙබර්ගේ අදහස් සංක්ෂිප්තව විස්තර කරන්න.
(ලකුණු 15)

05. ලාංකේය සමාජයේ ආගම සහ දේශපාලනය අතර තීව්‍ර සබඳතාවක් නිර්මාණය වීමෙහිලා බලපා ඇති සමාජ දේශපාලනික හේතු පැහැදිලි කරන්න.
(ලකුණු 15)

06. ගෝලීයකරණයෙහි මතවාදීමය දේශපාලනය ගොඩනැගී ඇත්තේ කෙසේ ද? විග්‍රහ කරන්න.
(ලකුණු 15)

07. නූතන ජාත්‍යන්තර සමාජය තුළ ජාතික රාජ්‍යය මුහුණ පා ඇති අභියෝග සැකෙවින් විස්තර කරන්න.
(ලකුණු 15)

08. "ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය මානව සමාජ දේශපාලන පරිණාමයේ අවසන් ආදර්ශය බවට පත් වී ඇත." ඉහත ප්‍රකාශය විග්‍රහ කරන්න.
(ලකුණු 15)

@@@@@@@@

51